# පටු අදහස් වලට දැන් තැනක් නෑ සියලු ජාතින් එක්ව රට නැගිය යුතු කාලය ඇවිත්



අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා උත්සව සභාව අමතමින්



උත්සවයට සහභාගි වූ පිරිසෙන් කොටසක්

# ජාතික ගීය දෙමළෙන් ගැයිම විවේචනය කරන්නේ

# කම්බන්විලා සමරු උළෙලේදී අගමැති රනිල් වික්‍රමසිංහ කියයි

යන්න ඒ සංවාදයයි. අතීතයේ භාවිත වූ සිංහ කොඩියෙන් සෙසු ජාතීන් නියෝජනය වූයේ නැහැ.

අනතුරුව ජාතික කොඩිය පිළිබඳව තීරණයකට පැමිණීම සඳහා සියලුම ජාතීන්ගෙන් සමන්විත වූ කමිටුවක් පිහිටුවා ගනු ලැබුවා. ඩී.එස්. සේනානායක වැනි සිංහල නායකයන් ද, පොන්නම්බලම් අරුණාචලම් වැනි දෙමළ

දමනු ලැබුවා. නමුත් පසු කාලීනව පත් වූ රජයන් මගින් ඒ කාර්යය හරියාකාරව වූයේ නැහැ.

එක්සත් ජාතික පෙරමුණු ජාතික රජය ජාතික සමගිය සහ සංහිඳියාව ඇති කිරීමේ මූලික පියවරක් ලෙස ජාතික ගීය නැවතත් දෙමළ බසින් ගායනා කිරීම ඇරඹුවා. පසුගිය නිදහස් දින උත්සවයේදී සියලුම ජාතීන් සැබවින්ම "එක මවකගෙ දරුවන්" යන කියමන සනාථ කරමින්

